චක්‍රලේඛ අංකය: 8/2005 /21

මගේ අංකය- එම්.10/විවිධ/පොදු/සුනාමි/2005.

රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව,
අංක.280, කෙලින් වීදිය,
කොළඹ 11.

2005, ජූලි මස 13 වැනි දින.

සියලුම ප්‍රාදේශීය ලේකම්/දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර්වරුන් වෙත.

## සුනාමි ව්‍යසනයෙන් අතුරුදහන් වූ අයගේ මරණ ලියාපදිංචි කිරීම

2005 අංක 16 දරණ සුනාමි (විශේෂ විධිවිධාන) පනත දැන් ක්‍රියාත්මකය. එකී පනතේ 1 වන කොටසේ සුනාමි ව්‍යසනය නිසා අතුරුදහන් වූ අයගේ මරණ ලියාපදිංචි කිරීම සඳහා විධිවිධාන ඇතුලත් කර ඇත.

02. මේ අනුව එකී පනතේ 2 හා 3 වන වගන්ති අනුව සුනාමි ව්‍යසනය නිසා අතුරුදහන් වූ අයගේ මරණ ලියාපදිංචි කිරීමට අදාළ අයදුම්පත් දැන් ඔබට භාරගත හැකි බව කාරුණිකව දන්වමි. ඒ අනුව අයදුම්පත් භාරගැනීමේ දී පහත සඳහන් උපදෙස් පරිදි කටයුතු කරන්න.

I. <u>ඉල්ලුම්කරු:-</u>

- මෙම පණත යටතේ මරණ ලියාපදිංචි කිරීම සඳහා ඉල්ලුම් කළ යුත්තේ මියගිය බවට විශ්වාස කරන පුද්ගලයාගේ ළඟම ඥාතියා විසිනි.

- එවැනි තැනැත්තෙකු නොමැති නම් මියගිය බවට විශ්වාස කරන තැනැත්තා පිළිබඳව තොරතුරු දන්නා වෙනයම් අයෙකුට ඉල්ලුම් කළ හැකිය.

II. <u>ඉල්ලුම් කළ යුතු ආකාරය :-</u>

ඉල්ලුම්පත් ඉදිරිපත් කළ යුතු වන්නේ පණතේ පළමුවෙනි කොටසේ දෙවැනි උපලේඛණයේ සඳහන් ආකෘතියට අනුකූලව මියගිය බවට විශ්වාස කරන තැනැත්තා පදිංචිව සිටි ග්‍රාම නිළධාරි වසමේ ග්‍රාම නිළධාරිවරයා වෙතය. මෙම අයදුම්පත සමඟ විධිමත් පරිදි සකස් කළ දිවුරුම් ප්‍රකාශයක් ද ග්‍රාම නිළධාරිවරයාට භාරදිය යුතුවේ. මේ සඳහා උපයෝගී කරගත යුතු අයදුම්පතේ පිටපතක් මෙම චක්‍රලේඛයට අමුණා ඇත. එකී ආකෘතියට අනුව සකස් කරන ලද කවර අයදුම්පතක් වුවද භාරගත හැක.

III. <u>ඉල්ලුම්පත් මත ක්‍රියා කිරීම. :</u>

(අ) ග්‍රාම නිලධාරිවරයා ඉහත සඳහන් පරිදි අයදුම්පත ලබා ගැනීමෙන් පසුව එම අයදුම්පත මත මරණ සහතිකයක් නිකුත් කිරීම පිළිබඳව කිසියම් විරෝධතා ඇත්නම්, ඒවා සති දෙකක් ඉක්මයාමට පෙර ඉදිරිපත් කරන මෙන් දැන්වීමක් ඔහුගේ දැන්වීම් පුවරුවේ විධිමත් ලෙස පළ කළ යුතුවේ. එම සති දෙක අවසානයේ පරීක්ෂණයක් පැවැත්වීම අවශ්‍ය යයි ඔහු සිතන්නේ නම් එසේ කිරීමෙන් පසුව ප්‍රදේශයේ පොලිස් ස්ථානය භාර ස්ථානාධිපතිවරයාගෙන් ලබාගත් වාර්තා සමඟ අදාළ ලියකියවිලි ප්‍රදේශයේ ප්‍රාදේශීය ලේකම්වරයා වෙත ඉදිරිපත් කළ යුතුවේ. එසේ ඉදිරිපත් කිරීමේ දී ඔහුගේ වාර්තාවේ සඳහන් සිද්ධිමය කරුණුවල නිරවද්‍යතාවය පිළිබඳව සහතික කළ යුතුය.

(ආ) අදාළ ප්‍රාදේශීය ලේකම්වරයා ඉහත කී වාර්තාව පිටපත් කර රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුවේ අදාළ කලාප කාර්යාලය භාරව කටයුතු කරන සහකාර රෙජිස්ට්‍රාර් ජනරාල්වරයා වෙත යැවිය යුතුවේ. එකී සහකාර රෙජිස්ට්‍රාර් ජනරාල්වරයා ඉහත කී ලියවිලි පිළිබඳව සෑහීමකට පත්වීමෙන් පසුව එකී මරණ ලියාපදිංචි කිරීම සඳහා නියෝගයක් ලබා දී මරණය සිදු වූ ස්ථානය අයත්වන කොට්ඨාශයේ උප්පැන්න හා මරණ ලියාපදිංචි කිරීමේ රෙජිස්ට්‍රාර්වරයා වෙත යැවිය යුතුය. රෙජිස්ට්‍රාර්වරයා එකී මරණය විධිමත් ලෙස ලියාපදිංචි කිරීමෙන් පසුව අයදුම්පතේ සඳහන් අයදුම්කරුගේ නමට නොමිළයේ නිකුත් කළ යුතු මරණ සහතිකය ලැබීමට සැළැස්විය යුතුය.

<u>ඉහත කී කලාප කාර්යාලවල ලිපිනයන් පහත සඳහන් වේ. :</u>

01. සහකාර රෙජිස්ට්‍රාර් ජනරාල්,
දකුණු කලාප කාර්යාලය,
රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව,
කොටුව,
ගාල්ල.

02. සහකාර රෙජිස්ට්‍රාර් ජනරාල්,
බස්නාහිර කලාප කාර්යාලය,
රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව,
මාකස් ප්‍රනාන්දු මාවත,
කොළඹ 07.

03. සහකාර රෙජිස්ට්‍රාර් ජනරාල්,
වයඹ උතුරු මැද කලාප කාර්යාලය,
රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව,
වත්තිම් පාර,
කුරුණෑගල.

04. සහකාර රෙජිස්ට්‍රාර් ජනරාල්,
ඌව සබරගමු කලාප කාර්යාලය,
රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව,
නව නගරය,
රත්නපුර.

05. සහකාර රෙජිස්ට්‍රාර් ජනරාල්,
උතුරු නැගෙනහිර කලාප කාර්යාලය,
රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව,
මඩකලපුව. /යාපනය.

06. සහකාර රෙජිස්ට්‍රාර් ජනරාල්,
මධ්‍යම කලාප කාර්යාලය,
රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව,
මහනුවර.

03. මෙ සම්බන්ධව යම් පැහැදිලි කිරීමක් අවශ්‍ය නම් සහකාර රෙජිස්ට්‍රාර් ජනරාල් ඩී.එම්.ඩී.බී.කේ.ජයසේන මහතා අමතන්න. ඔහුගේ දුරකතන අංකය 2393077 වේ.

රෙජිස්ට්‍රාර් ජනරාල්.
එල්. කේ. රත්නසිරි
රෙජිස්ට්‍රාර් ජනරාල්

පිටපත් :- 1. ලේකම්, රාජ්‍ය පරිපාලන සහ ස්වදේශ කටයුතු අමාත්‍යාංශය. - දැනගැනීම සඳහා.
2. ලේකම්, අධිකරණ සහ අධිකරණ ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශය. - -එම-
3. සියලුම දිස්ත්‍රික් ලේකම්වරුන් / අතිරේක රෙජිස්ට්‍රාර් ජනරාල්වරුන්. - -එම-
4, සියලුම කලාප භාර සහකාර රෙජිස්ට්‍රාර් ජනරාල්වරුන්. - අවශ්‍ය කටයුතු සඳහා.
5. සියලුම ඉඩම් රෙජිස්ට්‍රාර් සහ අතිරේක දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර්වරුන් වෙත. - දැනගැනීම සඳහා.
6. සුනාමි ව්‍යසනය බලපෑ ප්‍රදේශවල සේවය කරන උප්පැන්න හා මරණ ලියාපදිංචි කිරීමේ රෙජිස්ට්‍රාර්වරුන් වෙත.- අවශ්‍ය කටයුතු සඳහා.

N/Sunami/11

<u>2005 අංක 16 දරන සුනාමි(විශේෂ විධිවිධාන) පනත</u>
<u>2005 ஆம் ஆண்டின் 16 ஆம் இலக்க சுனாமி (விசேட ஏற்பாடு) சட்டம்</u>
**<u>Tsunami (Special Provisions) Act, No. 16 of 2005</u>**

<u>අතුරුදහන් වූ තැනැත්තකු සම්බන්ධයෙන් සහතිකයක් නිකුත් කරවා ගැනීම සඳහා ඉල්ලුම් පත්‍රය</u>
<u>காணாமற்போன ஆளொருவரின் இறப்புச் சான்றிதழொன்றின் வழங்குதகைக்கான விண்ணப்பம்.</u>

## APPLICATION FOR ISSUE OF A CERTIFICATE OF DEATH OF A MISSING PERSON

................................ ග්‍රාම නිලධාරී වෙත:
கிராம அலுவலருக்கு: ...........................................
**To : The Grama Niladhari of .........................**

1. අතුරුදහන් වූ තැනැත්තාගේ සම්පූර්ණ නම:-
   காணாமற்போன ஆளின் முழுப்பெயர் :-
   Full name of missing person:-

2. ස්ත්‍රීපුරුෂ භාවය:-
   பால் :-
   Sex:-

3. ජාතිය:-
   இனம் :-
   Race:-

4. වයස:-
   வயது :-
   Age:-

5. මියගිය දිනය:-
   இறந்த திகதி :-
   Date of death:-

6. අවසන්වරට පදිංචි ස්ථානයේ ලිපිනය:-
   தெரிந்த கடைசி வதிவிட முகவரி :-
   Address of last known residence :-

7. ස්ථිර වාසස්ථානයේ ලිපිනය:-
   நிரந்தர வதிவிட முகவரி :-
   Address of permanent residence:-

8. නිලය හෝ රැකියාව:-
   பதவி அல்லது தொழில் :-
   Rank or profession:-

9. ඉල්ලුම්කරුගේ සම්පූර්ණ නම:-
   விண்ணப்பகாரரின் முழுப்பெயர் :-
   Applicant's full name:-

10. ඉල්ලුම්කරුගේ පදිංචි ස්ථානය සහ දුරකථන අංකය:-
விண்ணப்பகாரரின் வதிவிடமும் தொலைபேசி இலக்கமும் :-
Applicant's place of residence and telephone No. :-

11. ඉල්ලුම්කරුගේ වෘත්තිය/රැකියාව:-
விண்ணப்பகாரரின் தொழில்/வாழ்க்கைத்தொழில் :-
Applicant's profession/occupation:-

12. ඉල්ලුම්කරුගේ සේවාස්ථානය සහ දුරකථන අංකය:-
விண்ணப்பகாரரின் தொழிலிடமும் தொலைபேசி இலக்கமும் :-
Applicant's place of employment and telephone No. :-

13. ඉල්ලුම්කරු අතුරුදන් වූ තැනැත්තාට ඇති සම්බන්ධය:-
காணாமற்போன ஆளுக்கும் விண்ணப்பகாரருக்குமுள்ள உறவு:-
Applicant's relationship to missing person:-

.................................................පදිංචි .................................................වන මා විසින් .................................................(අතුරුදන් වූ තැනැත්තාගේ නම) යන අය හය මාසයකට වඩා වැඩි කාලයක සිට අතුරුදහන්ව ඇති බව සහ එකී .................................................යන අය සුනාමි ව්‍යසන හේතුවෙන් මියගොස් ඇති බවට සැබැවින්ම විශ්වාස කරන බවට මෙයින් ප්‍රකාශ කරනු ලැබේ.

එම නිසා මා විසින් එකී මරණය. (110 වන අධිකාරිය වූ) උප්පැන්න සහ මරණ ලියාපදිංචි කිරීමේ ආඥා පනත යටතේ ලියාපදිංචි කරන ලෙස ඉල්ලා සිටිනු ලබන අතර එකී මරණය පිළිබඳව මරණ සහතිකය මා වෙත ලබා දෙන ලෙස ඉල්ලා සිටිමි.

.................................................என்னும் முகவரியைச் சேர்ந்த ஆகிய நான், சொல்லப்பட்ட (காணாமற்போன ஆளின் பெயர்) ஆறு மாதத்திற்கு மேலாக காணப்படாதுள்ளார் எனவும் சொல்லப்பட்ட.................................................என்பவர் இறந்து விட்டார் எனவும்................................................. சுனாமியினாலேயே இறப்பு நிகழ்ந்தது எனவும் நிச்சயமாக நம்புகிறேன் எனவும் இத்தால் நான் கூறுகிறேன்.

ஆகவே, இறப்பானது (110ஆம் அத்தியாயமான) பிறப்புகள், இறப்புக்கள் சட்டத்தின்கீழ் பதிவுசெய்யப்பட வேண்டுமெனவும் அத்தகைய ஆள் தொடர்பிலான இறப்புச் சான்றதழொன்று எனக்கு வழங்கப்பட வேண்டும் எனவும் நான் வேண்டுகிறேன்.

I ................................................................ of .........................................
......................................do hereby state that the said ............................................... (name of person missing)..............................has been missing for a period of over six months and I verily believe that the said ....................................................... is dead and that his death is attributable to the Tsunami.

I therefore request that the death be registered under the Births and Deaths Registration Act (Chapter 110) and a Certificate of Death in respect of such person be issued to me.

දිනය/தேதி:.Date : ....................

.........................................................
ඉල්ලුම්කරුගේ අත්සන /விண்ணப்பகாரரின் கை ப்பம்./Signature of Applicant